ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

இலங்கையின் பிரதம அமைச்சர்

**Prime Minister of Sri Lanka**

## පොසොන් දින පණිවුඩය.

ශ්‍රී සම්බුද්ධ ශාසනය මෙරට ස්ථාපිත කළ මිහිඳු මහ රහතන් වහන්සේගේ ඓතිහාසික ධර්ම දූත මෙහෙවර සිහිපත් කරමින් සැමරෙන උතුම් පොසොන් පුර පසළොස්වක පොහොය ආධ්‍යාත්මික අවබෝධය, ප්‍රඥාව සහ සමාජ සමානාත්මතාව අපට සිහිපත් කරන ඉතා පුණ්‍යවන්න දිනයකි.

පොසොන් පොහොය යනු ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ආගමික සිදුවීමක් පමණක් නොව, ජාතියක චින්තනය, සංස්කෘතිය සහ සදාචාරාත්මක ජීවන රටාව පරිවර්තනය කළ ඓතිහාසික සංධිස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේගේ ශ්‍රී ලංකාගමනයත් සමඟ දේශයට දායාද වූ බෞද්ධ දර්ශනය, සියවස් ගණනාවක් පුරා අපගේ ජාතික අනන්‍යතාව හැඩගැස්වූ අමිල උරුමයක් බවට පත්විය.

පොසොන් පොහොය අපට සිහිපත් කරවන්නේ සැබෑ සංවර්ධනය ආරම්භ වන්නේ මිනිසාගේ සිත තුළින් බවයි. කරුණාව, දයාව, සමානාත්මතාව, විනය සහ වගකීම වැනි උතුම් බෞද්ධ වටිනාකම් සමාජයේ පදනම බවට පත් කළ හැකි නම්, සාමකාමී, සාධාරණ සහ සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම අපට වඩාත් පහසු වනු ඇත.

අද අපේ රට නව බලාපොරොත්තු සහිත ගමන් මඟකට පිවිස සිටී. එම ගමන සාර්ථක කර ගැනීමට ආර්ථික ප්‍රගතිය පමණක් නොව, සදාචාරාත්මක වටිනාකම්වලින් සුපෝෂිත සමාජයක්ද අවශ්‍ය වේ. පොසොන් පොහොයේ සැබෑ හරය වන සදාචාරය, අවිහිංසාව සහ මානව දයාව, ජනතා අපේක්ෂා ඉටු කරන සාධාරණ හා සමෘද්ධිමත් රටක් ගොඩනැගීම වෙනුවෙන් වූ රජයේ අරමුණ වෙත මඟපෙන්වීමකි.

ලැබුවා වූ උතුම් පොසොන් පුර පසළොස්වක පොහොය දිනය සියලුම බෞද්ධ ජනතාවගේ ජීවිතවලට නිවීම, සැනසීම, ප්‍රඥාව සහ සෞභාග්‍ය උදා කරන පින්බර පොහොය දිනයක් වේවායි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය හරිනි අමරසූරිය
අග්‍රාමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය